

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2000 අංක 45 දරන උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත

[සභාතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2000 අගෝස්තු මස 11 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 යි. **තැපැල් ගාස්තුව : රු. 3.50 යි.**

2000 අංක 45 දරන උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත

[සභානිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 34/99.

උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම සඳහා ද, ඒට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කුඩුඩු නාමය.

1. මේ පනත 2000 අංක 45 දරන උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීම.

2. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ආයතනය මෙම වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද, ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කරනු ලැබිය හැකි ය.

කළමනාකරණ මණ්ඩලය.

3. (1) ආයතනයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ; සහ

(ඇ) රාජ්‍ය ආරක්ෂාව, රාජ්‍යතාන්ත්‍රික භාවය, ජාත්‍යන්තර සම්බන්ධතා හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයන්හි පළපුරුද්දක් ඇති හා හැකියාවන් පෙන්නුම් කර ඇති තැනැත්තන් අතුරින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් පස් දෙනෙක්.

(3) ජනාධිපතිවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති විධිවිධාන මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම හා ඔවුන්ගේ ධුර කාලය, ඒ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් සහ ආයතනයේ මුද්‍රාව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ආයතනයේ කර්තව්‍ය.

4. ආයතනයේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) ජාතික උපායමාර්ග සැකසීමේ ලා අවශ්‍ය තොරතුරු හා දත්තයන් අදාළ බලධාරීන්ට ලබාදීම ;

(ආ) රාජ්‍ය ආරක්ෂාව, ජාතික ආරක්ෂාව හා ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ප්‍රතිපත්ති සැකසීම හා අගැයීම සඳහා එහි ප්‍රතිඵල උපයෝගී කර ගැනීමේ අදහසින්, රාජ්‍ය ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයනයන් පැවැත්වීම ;

(ඇ) රාජ්‍ය ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න පිළිබඳව අදාළ සහ විශ්වාසදායක තොරතුරු ලබාගැනීම සහතික කිරීමේ පරමාර්ථයෙන්, එකී විෂයයන් පිළිබඳව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් පර්යේෂණ කිරීමට උනන්දු කරවීම ;

(ඈ) රාජ්‍ය ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ පවත්වනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකාරකව කටයුතු කිරීම හා එසේ සම්බන්ධීකාරකව කටයුතු කිරීමෙහි ලා අවශ්‍ය පර්යේෂණ, සාකච්ඡා කිරීම් හා අගැයීම් සඳහා අවශ්‍ය හා සුදුසු පසුතලය සකසා දීම ;

(ඉ) රාජ්‍ය ආරක්ෂාවට හෝ ජාතික ආරක්ෂාවට අදාළ වන හෝ බලපාන සමාජ, දේශපාලන හා ආර්ථික ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ පැවැත්වීම ;

(ඊ) යුධ උපාය, යුධ කටයුතු පිළිබඳ ශිල්ප ක්‍රම, ජාත්‍යන්තර සම්බන්ධතා හා නීති ක්‍රම පිළිබඳ සාකච්ඡාවන් හා ඒ පිළිබඳ තොරතුරු හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(උ) රාජ්‍ය ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ කාරණා පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයනයන් භාර ගැනීම සඳහා හැකියාවක් ඇති පුහුණු පිරිසක් බිහි කිරීම ;

(ඌ) රාජ්‍ය ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අදාළ වන්නා වූ කාරණා පිළිබඳව තොරතුරු සංචිතයක් පිහිටුවීම.

ආයතනයේ බලතල.

5. ආයතනයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා එයට පහත සඳහන් බලතල ඇත්තේ ය:—

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ විකිණීම, බද්දට දීම, උකස් කිරීම, භුවමාරු කිරීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වා ගෙන යාම ;

(ඇ) එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළුවීම ;

(ඈ) ආයතනය මගින් තීරණය කරනු ලබන සුරුකුම්පත්වල එහි අරමුදල් ආයෝජනය කිරීම ;

(ඉ) පර්යේෂණ කාර්යය සඳහා පුස්තකාල, ප්‍රලේඛන මධ්‍යස්ථාන සහ ලේඛනාරක්ෂක මධ්‍යස්ථාන ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම හා නඩත්තු කිරීම ;

(ඊ) ලේකම් කාර්යාලයක් පිහිටුවීම හා පවත්වා ගෙන යාම ;

(උ) ආයතනයේ කර්තව්‍යයන්ට අදාළ විෂයයන් පිළිබඳ වාර්තා, වාර සඟරා හා ලිපි එකතු කිරීම, මුද්‍රණය කිරීම හා පළ කිරීම ;

(ඌ) ආයතනයේ කර්තව්‍යයන්ට අදාළ විෂයයන් පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම ;

(එ) ආයතනයේ කර්තව්‍ය හා සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක පිහිටා ඇති වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් සහ සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කිරීම ;

(ඒ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික සියලු දේ කිරීම.

II වන කොටස

ආයතනයේ කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්වරයා.

6. (1) ජනාධිපතිවරයා විසින්, මණ්ඩලය විමසා පත් කරනු ලැබිය යුතු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් සිටිය යුතු ය.

(2) මණ්ඩලයේ විධානයන්ට යටත්ව ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමට හා කාර්ය මණ්ඩලය පත් කිරීම හා විනය පාලනය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය. තවද, ඔහු මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කළ යුතු ය. එසේම මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අතර, මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි එවැනි වෙනත් කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගි වීමට හා එහිදී තම අදහස් ප්‍රකාශ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම් තිබිය යුතු නමුත් එහිදී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොතිබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය ආදීන් පත් කිරීම.

7. (1) ආයතනය විසින් මේ පනතේ විධිවිධානයන්ට යටත්ව —

(අ) එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයන් හෝ සේවකයන්ගේ විනය පාලනය කිරීම හෝ ඔවුන් සේවයෙන් පහ කිරීම සිදු කළ හැකි ය ;

(ආ) ඒ නිලධරයන් හා සේවකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අනුප්‍රමාණ නියම කළ හැකි ය ;

(ඇ) ඒ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ සේවා කොන්දේසි හා නියම නිශ්චය කළ හැකි ය ;

(ඈ) ඒ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ සුභ සිද්ධිය පිණිස අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා ඒවා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලක් හෝ යෝජනාක්‍රමයක් සඳහා දායක මුදල් ගෙවීම සිදු කළ හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

8. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද, අදාළ අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශවල ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ රජයේ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වී සිටින යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් පිළිබඳ කොන්දේසි ද ඇතුළුව, මණ්ඩලය හා ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟවනු ලැබිය හැකි කොන්දේසි මත, ඒ සේවා නියුක්තයා ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත්වන විනය පාලනයකට ඒ නිලධරයා හා සේවකයා ද යටත් විය යුතු ය.

(7) මේ වගන්තියේ "උසස් අධ්‍යාපන ආයතනය" හා "ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුම්වල 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතෙහි ඒවාට පිළිවෙලින් දී ඇති අර්ථ කථනයම ඇත්තේ ය.

III වන කොටස

මුදල්

ආයතනයේ අරමුදල්.

9. (1) ආයතනයට ආයතනයේම අරමුදලක් තිබිය යුතු ය.

(2) ආයතනයේ අරමුදලට—

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) කවර හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග හා ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ, ආයතනයේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ මේ පනතෙහි වෙනත් යම් විධිවිධානයක් මගින් අරමුදලින් ගෙවිය යුතු බවට බලය ලබාදී ඇති හෝ නියම කර ඇති වෙනත් යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

10. (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ ආයතනයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

IV වන කොටස

පොදු විධිවිධාන

අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධාන.

11. මණ්ඩලය විසින් එහි බලතල හා කර්තව්‍ය ප්‍රතිපත්තිමය කාරණාවලට අදාළ වන තාක් දුරට ක්‍රියාත්මක කිරීමෙහි ලා හා ඉටු කිරීමෙහි ලා, ජනාධිපතිවරයා විසින් කලින් කල මණ්ඩලය විමසීමෙන් අනතුරුව, ලියවිල්ලකින් මණ්ඩලයට යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන බලාත්මක කරනු ලැබිය යුතු ය.

ආයතනයේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

12. මණ්ඩලයේ සියලු සාමාජිකයන් හා ආයතනයේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

13. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

රහස්‍යතා ප්‍රකාශන.

14. (1) මණ්ඩලයේ සෑම සාමාජිකයකුම සහ ආයතනයේ සෑම නිලධරයකුම හා සේවකයකුම, ස්වකීය කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම, ආයතනයේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ සියලු කරුණු පිළිබඳව දැඩි රහස්‍යතාවක් පිළිපදින බවට වූ ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය මගින්—

(අ) එසේ කිරීමට අධිකරණයක් මගින් නියම කරනු ලැබූ විට ;

(ආ) මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීම සඳහා හැර, ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී තමා දැනගත් කරුණු කිසිවක් හෙළිදරව් නොකිරීමට

එකී ප්‍රකාශයෙන් ප්‍රතිඥා දෙනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී ඔහු විසින් ලබාගන්නා යම් තොරතුරක් (1) වන උපවගන්තිය මගින් බලය දී ඇති කාර්යයක් සඳහා හැර වෙනත් යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළිදරව් කරන මණ්ඩලයේ සාමාජිකයකු හෝ ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු මගින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

15. (1) (අ) ආයතනය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව : හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි ආයතනය විසින් හෝ ආයතනයට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් දරන ලද යම් වියදමක්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනයට ගෙවන ලද හෝ ආයතනය විසින් අයකර ගන්නා ලද නඩු ගාස්තු කිසිවක්, ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවේ නම් හැර, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රජයේ වංචල හා නිශ්චල දේපළ, ආයතනයට ලබාදිය යුතු බව.

16. (1) රජයේ යම් නිශ්චල දේපළක්, ආයතනයේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, ඒ දේපළ රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි හෝ කාර්යයක් සේ සැලකිය යුතු අතර, ඒ අනුව, ආයතනය වෙත ඒ දේපළ සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට හෝ ඒ ආඥා පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) රජයේ යම් වංචල දේපළක්, ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ඒ දේපළ පිළිබඳ අධිකාරියක් හා පාලනයක් ඇති අමාත්‍යවරයා විසින් ඒ වංචල දේපළෙහි සන්තකය හා ප්‍රයෝජනය ආයතනය වෙත පවරා සතු කර දිය හැකි ය.

වාර්ෂික වාර්තාව.

17. ආයතනයේ එක් එක් මුදල් වර්ෂය අවසානයේ, මණ්ඩලය විසින් ඒ වර්ෂය තුළ එහි ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පළ කරනු ලැබිය යුතු අතර, අනුමැතිය සඳහා එය ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ජනාධිපතිවරයා විසින් අනුමත කිරීමෙන් පසු ඒ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

උපලේඛනය [3(4) වන වගන්තිය]

මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ වන්නා වූ විධිවිධාන

1. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකුව සිටීම නතර වුවහොත් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ පිහිටිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම්, විද ඇත්නම් ;

(ඉ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තිය හෝ 306 වන වගන්තියේ විධිවිධාන යටතේ මහු සම්බන්ධයෙන් ක්‍රියාකර ඇත්තේ නම්,

ඒ තැනැත්තා, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් දිගටම කටයුතු කර ගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

2. මණ්ඩලයේ සෑම සාමාජිකයකුම, මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් හිස් කරනහොත් මිස, තමා පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, මහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය :

එසේ වුව ද, මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් කරනු ලබන යම් සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයෙක් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය පදහා ධුරය දැරිය යුතු ය.

3. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින්, මණ්ඩලයේ යම් සාමාජිකයකු හේතු දන්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරන ලද්දේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, ඒ සාමාජිකයා ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට ස්වකීය ධුරය හිස් කර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

4. මණ්ඩලයේ සාමාජිකයකු විසින්, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබීම මත බලාත්මක විය යුතු ය.

5. මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවක දී, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් වෙමින්, ජනාධිපතිවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ ඒ සාමාජිකයා වෙනුවට පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

6. රෝගාතුරවීම, අබලතාවට පත්වීම හෝ මාස තුනකට නො අඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට මණ්ඩලයේ යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකියාව පිළිබඳව ජනාධිපතිවරයා වෙත ලිඛිතව දැනුම්දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. ඉන් අනතුරුව, ජනාධිපතිවරයා විසින් 3 වන වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් වෙමින් ඒ කාලය තුළ ඔහු වෙනුවෙන් වැඩ බැලීම පිණිස වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

7. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික, මණ්ඩලයේ සාමාජිකයන්ට ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

8. (1) (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම්, මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා කෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ඇත්තේ ය.

(4) මේ ඡේදයේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

9. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක් මණ්ඩලයේ කිසි ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල වන්නාක් සේ නොසැලකිය යුතු ය.

10. (1) ආයතනයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කොට සකස් කර ගත හැකි අතර, එය මණ්ඩලය විසින් නිශ්චය කරන යම් ආකාරයකට වෙනස් කරගනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ අවපරය ඇතිව සහ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, ආයතනයේ මුද්‍රාව යම් සාධන

පත්‍රයකට හෝ වෙනත් ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ දෙදෙනා ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(4) ආයතනයේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක්, මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු ය.

11. (1) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සභාපතිවරයාට ඔහුගේ ධුරයේ කාර්ය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවට කාර්ය ඉටු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින් ජනාධිපතිවරයා විසින් හේතු දන්වා සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා විසින්, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මඟින් ඕනෑම අවස්ථාවක සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් එය ලිඛිතව පිළිගනු ලැබීම මත බලාත්මක විය යුතු ය.

(4) (2) හා (3) උප ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්ව කාලසීමාව විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දයක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දයක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.